# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2327/07 - 2023 අප්‍රේල් මස 11 වැනි අඟහරුවාදා - 2023.04.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1973 අංක 25 දරන ක්‍රීඩා පනත

32 සහ 33 වගන්ති යටතේ නියමය

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය රොෂාන් රණසිංහ වන මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32(ආ) සහ 33 වගන්ති යටතේ මා වෙත පවරා ඇති බලතල අනුව රග්බි ක්‍රීඩාව සඳහා ජාතික සංගමය වන ශ්‍රී ලංකා රග්බි සම්මේලනයේ ලියාපදිංචිය වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවන අතර තාවකාලික කාර්ය ක්‍රමයක් වශයෙන් එකී සංගමයේ කටයුතු තවදුරටත් පවත්වාගෙන යාම සඳහා ස්ථාවර කරණ කමිටුවක් මාස 06ක කාලයක් සඳහා පත් කරමි.

| | | | |
|---|---|---|---|
| 1. | චූලා ධර්මදාස මහතා | - | සභාපති |
| 2. | ශානක රණසිංහ මහතා | - | ලේකම් |
| 3. | තුසිත පීරිස් මහතා | - | භාණ්ඩාගාරික |
| 4. | ඩී. ඩී. දමිත් විතාරනගේ මහතා | - | සාමාජික |
| 5. | කිෂාන් මුසාෆර් මහතා | - | සාමාජික |
| 6. | සවන්ත ද සේරම් මහතා | - | සාමාජික |
| 7. | සුභාෂ් ජයතිලක මහතා | - | සාමාජික |
| 8. | ප්‍රදීප් බස්නායක මහතා | - | සාමාජික |
| 9. | බ්‍රිගේඩියර් සුනිල් රණසිංහ මහතා | - | සාමාජික |

තවද, ශ්‍රී ලංකා රග්බි සම්මේලනයේ නිලවරණය පැවැත්වීම සඳහා 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සහ වලංගු ක්‍රීඩා නියෝග අනුව එම සම්මේලනයෙහි විශේෂ මහා සභා රැස්වීමක් කැඳවා එමඟින් නිලවරණ කමිටුවක් පත් කිරීම ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් මගින් සිදු කිරීමටත් නිලවරණ කමිටුව මගින් නිලවරණය කැඳවීම හා පැවැත්වීම අධ්‍යක්ෂ ජනරාල්ගේ අධීක්ෂණය යටතේ සිදු කිරීමටත් බලය පවරමි.

**රොෂාන් රණසිංහ** (පා.ම),
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය.

2023 අප්‍රේල් මස 11 වැනි දින,
කොළඹ දී ය.

EOG 04 - 0082

1A - G 39323 — 08 (2023/04)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*